**බලන්ගොඩ නගර සභාව**

**මහා සභා රැස්වීම් වාර්තාව – 2026.08.11**

මෙදිනට නියමිත න්‍යාය පත්‍රය සඳහා මෙම මහා සභා රැස්වීම 2026.08.11 දින පෙරවරු 10.00 ට බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ මූලාසනයෙන් නගර සභාවේ සභා ගර්භයේදී ආරම්භ විය.

මෙම අවස්ථාවේදී පැමිණ සිටි සභික නියෝජිතයින් පහත පරිදි වේ.

1. එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමා - ගරු සභාපති
2. නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා - ගරු උප සභාපති
3. ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
4. එම්.ටී.එම්. රුමි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
5. එම්. නිමල් කරුණාරත්න මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
6. එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
7. කේ.ජී. පේමදාස මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
8. එම්.ඩබ්. විමලසිරි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
9. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිණිය - ගරු නාගරික මන්ත්‍රිනී
10. පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිණිය - ගරු නාගරික මන්ත්‍රිනී
11. එන්.ඒ.එස්. චන්දන මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
12. ජී.ජී.ජී.එන්. සේනාරත්න මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
13. එස්.යූ.සී. ජයනක මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
14. එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
15. ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී
16. ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී

පැමිණ සිටින ගරු උප සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් පිළිගනිමින් සභාවේ න්‍යාය පත්‍රය අනුව ගරු සභාපතිතුමා විසින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ). පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම :**

බලන්ගොඩ නගර සභාවේ 2026.07.14 දින පැවති මහා සභාවේ වාර්තාව අවශ්‍ය විය හැකි සංශෝධන ද සමග ස්ථිර කරගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා 2026.17.14 දිනැති මහ සභා වාර්තාව සඳහා පහත සංශෝධන යෝජනා කරන ලදී.

- ඉදිරිපත් කර ඇති වාර්තාවේ පිටු අංක 31හි පෞද්ගලික මන්ත්‍රී පැහැදිලිකිරීම් යටතේ තමන්ගේ අදහස් දැක්වීමේ ශීර්ෂය ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ අදහස් දැක්වීමක් ලෙස යොදා ඇති බැවින් එය සංශෝධනය විය යුතු බව
- එම වාර්තාවේ පිටු අංක 31හි තමන් විසින් කළ ප්‍රකාශයක් "එහි නඩු කටයුතු අවසන් නම් ඒ ලබාගත හැකි බවත්" ලෙස සඳහන්ව ඇතත් "එහි නඩු කටයුතු අවසන් බැවින් එය ලබාගත හැකි බවත්" ලෙස සංශෝධනය විය යුතු බව

- එම වාර්තාවේ පිටු අංක 32 හි තමන් විසින් කළ ප්‍රකාශයක් "කරපු වැඩ මාස 9-10වෙනකල් ගෙවා නැති බවත්," යන්න "කරපු වැඩ වලට අදාළ බිල්පත් මාස 9-10 වනතුරු ගෙවීම්කර නැති බවත්, ලෙස සංශෝධනය විය යුතු බව

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව එම සංශෝධන සමග ස්ථිර කිරීම සුදුසු බව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තවදුරටත් සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

සභාවේ නිහඬතාවය අනුව සංශෝධන නොමැති බව පෙනී යන බැවින් 2026.07.14 දිනැති මහා සභා වාර්තාව සංශෝධන සහිතව ස්ථිර වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**(ආ). සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන : ඇත**

1. සභාවේ ලේකම් ලෙස කටයුතු කළ එස්.එච්.ඒ.කරුණාරත්න මහත්මිය විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමත් සමග සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ ස්ථාන මාරුකිරීම කිරීම මත එන්.ජී.ඩී.සී. වික්‍රමසිංහ මහතා 2026.07.21 දින බලංගොඩ නගර සභාවේ ලේකම් ලෙස රාජකාරී භාරගත් බව ගරු සභාපතිතුමා විසින් සභාවට නිවේදනය කරන ලදී.

2. ප්‍රසම්පාදන කාර්යයන් වලට අදාළ කටයුතු සඳහා අද දින මහා සභා අවස්ථාව අතරතුර මහා සභාව ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාකිරීමට නියමිත බැවින් ඒ සඳහා යෝජනා සම්මත මඟින් අවස්ථාව සලසගත යුතු බව ගරු සභාපතිතුමා විසින් සභාවට නිවේදනය කරන ලදී.

**(ඇ).සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා :** ලැබී නැති බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

**(ඇ).සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම :** ලැබී නැති බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

**(ඉ) .යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :** කල් දී ඇතිව ඉදිරිපත් වූ ප්‍රශ්න හතරක් (04) ඇති බව සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව,

1. ක්ලීන් ශ්‍රී ලංකා වැඩ සටහන යටතේ බළන්ගොඩ බස්නැවතුම්පල පොදු වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීමේ වර්තමාන තත්ත්වය කුමක්ද? ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිනියගේ ප්‍රශ්නය සඳහා එකී කර්මාන්තයට අදාළව පහත කරුණු ඇතුළත් පිළිතුර ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශකර අදාළ ලේඛනය සභාගත කරන ලදී.

| | |
|---|---|
| කර්මාන්තයේ ඇස්තමේන්තු මුදල | - රු.18,297,913.11 |
| කර්මාන්තයේ කොන්ත්‍රාත් වටිනාකම | - රු.14,346,309.93 |
| ගිවිසුම්ගත කාලය | - දින 180 කි. |
| ගිවිසුම අවසන් වන දිනය | - 2026.06.20 |
| අවිනිශ්චිත මුදල | - රු.1,237,462.52 |

2026.06.18 වන දින වනවිට කර්මාන්තයේ ගිවිසුම්ගත වැඩ කොටසින් 95% ක් පමණ වැඩ කොටස් අවසන් කර ඇති නමුත්,

- ආබාධිත පුද්ගලයින් සඳහා (ගැහැණු/පිරිමි) ඉදි කරනු ලබන වැසිකිළි දෙකට අදාළ වැසිකිළි උපකරණ සවි කර නොමැත.
- Bathroom mirror 2 ක් සහ Soap Dispensers 2 සවි කර නොමැත.

කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් පරිබාහිරව ඇති වූ විශේෂිත ප්‍රායෝගික දුෂ්කරතා සහ මිල ප්‍රතිපාදන සීමාවන් හේතුවෙන් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කර බාර දීමට බාධා එල්ල වී ඇති බව දන්වා ඇත.

- කාන්තා වැසිකිළි පද්ධතිය ප්‍රමාද වී භාර දීම
- ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ බලපෑම
- ඉහල මහලෙන් සිදු වූ ජල කාණ්ඩුව වැනි හේතු සලකා බලා කොන්ත්‍රාත් කාල සීමාව

026.06.20 දින සිට 2026.08.20 දක්වා මාස දෙකකින් දීර්ඝ කර ඇත.
ඇස්තමේන්තු මුදල හා අවිනිශ්චිත මුදලට අමතරව,

- වැසිකිළි ගලි පද්ධතිය සඳහා ආවරණයක් සකස් කිරිම.
- පිටත තීන්ත ආලේප කිරිම
- ගලි ටැංකි පද්ධතිය සහිත ස්ථාන සඳහා ආවරණ දැළක් ඉදිකිරීම
- උද්‍යාන අලංකරණය ආදී අතිරේකව ඉටු කළ යුතු වැඩ කොටස් සඳහා විධිමත් මූල්‍ය

අනුමැතියක් සහ අතිරේක ප්‍රතිපාදන වෙන්වන තෙක් දැනට කර්මාන්තයේ වැඩ කොටස් නතර කර ඇත.

මෙම ප්‍රශ්නය තමා විසින් යෝජනාවක් ලෙස ඉදිරිපත් කළත් එය විමසන ලද ප්‍රශ්නයක් ලෙස න්‍යාය පත්‍රයට ඇතුළත් වීම සුදුසු නැති බවත්, ඒ සඳහා අදහස් දැක්වීමට අවස්ථාවක් නොලැබීම ගැටළුවක් බවත්, කරුණු වැඩිදුර පැහැදිලි කරගැනීමට මේ නිසා බාධාවන බවත්, මෙය න්‍යාය පත්‍රයේ යෝජනාවක් ලෙස ඇතුළත් නොවීමට හේතුව කුමක්ද යන්නත් ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිනිය විසින් විමසන ලදී.

විමසා ඇති කරුණ සහ න්‍යාය පත්‍රයේ ප්‍රශ්න යටතේ ඉදිරිපත් කර ඇති කරුණු තුළ සභාවේ තීරණයක් ගැනීමට කරුණු හඳුනාගත නොහැකි නිසාත්, අදාළ ඉදිරිපත් කිරීම යෝජනාවක ස්වරූපයේ නොවීමත් නිසා කල් දී ඇති ප්‍රශ්නයක් ලෙස සලකා පිළිතුරු සකස් කිරීමට කටයුතු කළ බවත්, තවදුරටත් පැහැදිලි කරගැනීමට කරුණු ඇත්නම් විමසා දැනගැනීමට බාධාවක් නොමැති බවත් ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී.

**2.** බලන්ගොඩ බස්නැවතුම්පළ ඉදිරිපිට භූමියේ පෞද්ගලික බස් රථ නවතා තැබීම සිදුකරනු ලබන බැවින් ඒ වෙනුවෙන් සභාවට ලැබෙන ආදායම් තත්ත්වය කෙසේද? ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිනියගේ ප්‍රශ්නය සඳහා මෙම භූමිය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කුලී පදනම මත ලබාගනු ලැබුයේ 2026 ජූනි 09 වන දින බවත්, ඒ අනුව ජූනි මස දින 19ක් වෙනුවෙන් රු.21,400ක මුදලක්ද, ජූලි මස දින 24ක් වෙනුවෙන් රු.34,400ක මුදලක්ද අය වී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් පිළිතුරු ලබා දෙමින් පැවසීය.

මෙය තවමත් විධිමත් පරිදි ක්‍රියාත්මක නොවන බැවින් පසුගිය අගොස්තු මස 06 වැනිදා පොලිසියේ රථවාහන අංශයේ නිලධාරියෙක්, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකු සහ පාසල් බස් රථ සංගමයේ සාමාජිකයන් ගෙන්වා සාකච්ඡාවක් පැවති

බවත්, ඒ අනුව ඉදිරියේදී පවතින අඩුපාඩු සකස් කර එහි කටයුතු විධිමත් කරන බවත් ගරු සභාපතිතුමා වැඩිදුරටත් පවසන ලදී.

මෙම ස්ථානයේ ජලය හා වැසිකිලි පහසුකම් සලසා තිබේද යන්න සහ ගාස්තු අයවීම තීරණය වු පරිදිම සිදු වන්නේද යන්න පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිනිය විසින් විමසන ලදී. වැසිකිලි හා ජල පහසුකම් මෙම ස්ථානයේ නොමැති බවත්, ඇතුල් කරන වාහන වලින් තීරණය වු ගාස්තුව අය කරන බවත් සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නගරය පුරා වාහන නැවැත්වීම විධිමත් කිරීමේ අවශ්‍යතාවය සහ මෙම ස්ථානයට ගෙවීම් කරන මුදල හා නඩත්තු වියදම් ආවරණය කරගැනීමට ප්‍රමාණවත් මුදලක් අයකර ගැනීමට නොහැකි වුවහොත් එය සභාවට අලාභයක් කළා යැයි චෝදනාවක් විය හැකි බැවින් මේ සඳහා කඩිනමින් මැදිහත් වන ලෙසත්, මෙම ස්ථානයට වෙනම පොදු පහසුකම් සැලසීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් නොවන බවත් සඳහන් කරමින් කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

මෙම පොදු පහසුකම් නාගරික සංවර්ධන අධිකාරිය හරහා ලබාගැනීම වඩා සුදුසු බවට අවධානය යොමු කරමින් එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

**3.** බුද්ධ ජයන්ති මාවතේ තුඹගොඩ සිට බුද්ධ ජයන්ති විද්‍යාලය දක්වා කොටස නඩත්තුව සඳහා දරණ ලද වියදම කොපමණද? ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ ප්‍රශ්නය සඳහා පහත කරුණු ඇතුළත් පිළිතුර සභාපතිතුමා විසින් ප්‍රකාශකර අදාළ ලේඛනය සභාගත කරන ලදී.

බුද්ධ ජයන්ති විද්‍යාල මාවත 2025 සැප්තැම්බර් මස ප්‍රිමික්ස් යොදා නඩත්තු කර ඇති අතර පහත වියදම් දරා ඇත.

- ද්‍රව්‍ය වියදම -රු.36,709.60
- කම්කරු ශ්‍රමය -රු.7,800.00
- මුළු වියදම -රු.44,509.60

බුද්ධ ජයන්ති පාසල් මාර්ගය කොන්ක්‍රීට් පුවරු යෙදීම 2025 මැයි මස සිදු කර ඇති අතර පහත වියදම් දරා ඇත.

- ද්‍රව්‍ය වියදම -රු.23,986.00
- කම්කරු ශ්‍රමය -රු.9,900.00
- මුළු වියදම -රු.33,886.00

මීට අමතරව තණකොළ කපා සුද්ද කිරීම් ආදි නඩත්තු කටයුතු සිදු කර ඇති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

පසුගිය වර්ෂයේ අලුත්වැඩියාව සිදුකළත් නැවත අබලං වී ඇති බවත්, අලුත්වැඩියාවන්ගේ ප්‍රමිතිය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු බවත්, මෙම ස්ථානයට තවත් ස්ලැබ් කෑට එකක් අවශ්‍යතාවය ඇති බවත්, මාර්ගය දිගේ ජලය ගලා යාම වැළැක්වීමට තාක්ෂණික කරුණු සැලකිල්ලට ගෙන කාණුව සකස්විය යුතු බවත් යන කරුණු අවධානයට ලක් කරමින් එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

**4.** 2026 මන්ත්‍රී ප්‍රතිපාදන සම්බන්ධව වර්තමාන තත්ත්වය සම්බන්ධව පැහැදිලි කරන්න. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ ප්‍රශ්නය සඳහා පිළිතුර ගරු සභාපතිතුමා පහත පරිදි ඉදිරිපත් කරන ලදී.

2026 වර්ෂයේ අයවැයෙන් ලක්ෂ පහ බැගින් මන්ත්‍රී ප්‍රතිපාදන වෙන් කළද පවතින ගැටළු හේතුවෙන් එම ප්‍රතිපාදන මඟින් කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත්, ඒ යටතේ මේ වන විට උපසභාපතිතුමාගේ යෝජනාවකට තුඹගොඩ සාංඝික විහාරස්ථානයේ පෙරහැර සඳහා රු.100,000 ක් ලබා දීම සහ මෛත්‍රී ප්‍රජාශාලාව සඳහා ජල විදුලි සැපයුම සම්බන්ධතාවය ලබාදීම 68,048.43 යන කර්මාන්ත සිදු කර ඇති බවත්, අනිකුත් යෝජනා තවම ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී ඇති බවත්,සභාවේ පවතින මූල්‍ය තත්ත්වය සහ පසුගිය වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.500,000 වෙනුවෙන් ලබා දුන් ප්‍රාග්ධන ඉල්ලීම් යම් යම් අවස්ථාවල වෙනස් වීම් සිදුවීම වැනි හේතු කීපයක් එයට බලපෑ බවත්,ඒ අනුව අදාළ වැය ශීර්ෂවල මුදල් ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවීම මත වැය ශීර්ෂ මාරු කළ බවත්, නමුත් ඒ මුදලත් දැනට කර ඇති ඉල්ලීම්වලට අදාළව ප්‍රමාණවත් නොවන තත්වයක් මතු වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා,

වැඩිදුරත් පැවසුයේ එබැවින් ප්‍රාග්ධන වියදම් යටතේ ඉල්ලීම් කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමට මෙම අවස්ථාවේ යෝජනා කරන බවත්, ඊට අමතරව මෙම මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනා යටතේ යෝජනා කළ යම් යම් ව්‍යාපෘති සඳහා පරිපූරකයේ මුදල් වලින් ඉෂ්ට කරගැනීමේ හැකියාව ඇති බවත්, උදාහරණයක් ලෙස ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා ඕලුගංතොට පුරණගෙදර වානක මහතාගේ නිවස අසල මාර්ගය නඩත්තු කිරීමට යෝජනා කර තිබූ බවත්, එය පරිපූරකය යටතේ යෝජනා කර අනුමත වී ඇති බවත්

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමාගේ යෝජනාව වන රිෂානා ජෙම්ස් අසල මර්සූක් මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කර්මාන්තයකින් සිදු කර ගැනීමට ලබා දී ඇති බවත්,

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය උඩකන්ද පාරේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම යෝජනා කර තිබූ බවත්, එයටද පරිපූරක මුදල් වලින් ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්,ඒ අනුව හැකි තරම් ප්‍රාග්ධන යටතේ ඉල්ලා ඇති යෝජනා ඉෂ්ට කිරීමට උත්සාහ කරමු යන්නත් ඉදිරියේදී ප්‍රමාණවත් මුද්දර ගාස්තු මුදලක් ලැබීමට නියමිතව තිබෙන බැවින් එයින් ඉතිරි යෝජනා ක්‍රියාත්මක කර ගැනීමට බලාපොරොත්තු වන බවත් පවසන ලදී.

(ඊ). **යථා පරිදි කල් දී ඇති යෝජනා :** ලැබී ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී. ඒ අනුව,

**<u>යෝජනා අංක 1 ලෙස,</u>**බලංගොඩ නගර සභාව සතු පොදු වෙළඳ පොළ අංක 9, 10, 11, 12, 14 සහ 18 මාලු වෙළඳසැල් සහ අංක 15, 16 සහ 17 මස් වෙළඳසැල් 2027 වර්ෂය සඳහා බදු දීමේදී, 2026 වර්ෂයේ ගිවිසුම්ගත මාසික බදු වටිනාකම, අවම ලංසු මුදල ලෙස සලකා වාර්ෂික බදුකරුවෙකු තෝරාගැනීම සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය පුවත්පත් මගින් ප්‍රසිද්ධිය ලබාදී ටෙන්ඩර් කටයුතු ක්‍රියාත්මක කිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 2 ලෙස,</u>** බලංගොඩ නගරයේ රථ වාහන නැවතුම් කිරීමේ ගාස්තු අය කිරීම නගර සභාව විසින් ටෙන්ඩර් කර තෝරාගන්නා බදුකරුවෙකු මගින් සිදු කරයි. එම කාර්යය 2027 වර්ෂයට ක්‍රියාත්මක කිරීම සඳහා බදුකරුවෙකු තෝරාගැනීමේදී අවම මාසික ලංසු වටිනාකම රු. 200,000.00 ක් ලෙස සලකා (2026 වර්ෂයේ ගිවිසුම්ගත බදු වටිනාකම රු.181,110.00කි) ටෙන්ඩර් කටයුතු ක්‍රියාත්මක කිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාව කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එසේම මෙම කරුණ ක්‍රියාත්මක කිරීමේදී ගාස්තු එකතු කරන අය පිළිබඳව නියාමනයක් අවශ්‍ය බවත්, ඔවුන්ගේ ඇඳුම, නැවතුම් කාලය, ගාස්තු ප්‍රමානය, බදුකරු විසින් මෙම ස්ථාන වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම වැළැක්වීම, සඳහා කොන්දේසි ඇතුළත්ව බදුදීම් සිදුකළ යුතු බවට යෝජනාවට සංශෝධන එක් කරන ලදී.

ඔවුන් දැනට නිල ඇඳුමක් භාවිතා කරන බවත්, එහි රථ වාහන පාලක ලෙස සඳහන්ව ඇති බවත්, එය නුසුදුසු බවත්, එය භාවිතයෙන් ඉවත් විය යුතු බවටත් අවධානය යොමු කරමින් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ජේමදාස මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

ඒ අනුව බදු කටයුතු සම්බන්ධයෙන් බදු කොන්දේසි ලියවිල්ල සභාව විසින් අනුමත කිරීමට යටත්ව සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව, ගරු උපසභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 3 ලෙස</u>** බලංගොඩ නගර සභාව සතු පෞද්ගලික බස් රථ නැවතුම් ස්ථානයේ ගාස්තු අය කිරීම 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලැබුවේ සභාව විසින්මය. නමුත් එම කටයුතු 2027 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමේදී බදුකරුවෙකු මගින් ක්‍රියාත්මක කරන්නේද, ආයතනය මගින්ම ක්‍රියාත්මක කරන්නේද යන්න තීරණය කිරීම හා බදුකරුවෙකු තෝරාගන්නේ නම් ටෙන්ඩර් කිරීමේදී අවම ලංසු වටිනාකම තීරණය කරගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව කියවා ඉදිරිපත් කරන ලදී .

මෙම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බැවින් යෝජනාව ස්ථිර කරන බවත්, මෙම කාර්යය තාක්ෂණික උපකරණ මගින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ස්ථානයේ මුල් කාලයේ අඩු ආදායමක් ලැබුණත් දැන් ඊට වඩා කිහිප ගුණයක ආදායමක් ලැබෙන නිසා සභාව විසින්ම ආදායම රැස්කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ජේමදාස මහතා විසින් අදහස් දක්වන ලදී.

දැනට මාසික සාමාන්‍ය ආදායම රු.250,000ක් බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාව විසින් ආදායම් රැස් කරයි නම්, උදෑසන කාලයේ ද එම කටයුතු විධිමත්ව සිදු කළ යුතු බවට ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිණිය විසින් අදහස් දක්වන ලදී.

මෙම කටයුත්තට තාක්ෂණික උපකරණ ලබාගැනීමට කළ උත්සාහය ඉටු වූවාද විමසමින්, දිනපතා බස් රථ ප්‍රමාණය සැලකීමේදී ආදායම මීට වඩා වැඩි විය හැකි බවත්, උදෑසන ආදායම් අපතේ යාම වැළැක්විය යුතු බවත්, අවධානය යොමු කරමින් ගරු මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මහතා විසින් අදහස් දක්වන ලදී.

විධිමත්බව සඳහා බඳුදීම වැදගත් බව අවධානය යොමු කරමින් අදහස් දක්වමින්, දැනට මාසිකව ලැබී ඇති සාමාන්‍ය අගය ලෙස රු.250,000ක මුදල අවම ලංසු වටිනාකම ලෙස සලසා සභාව විසින් අනුමත කරන කොන්දේසි සමග ප්‍රාදේශීය ප්‍රසිද්ධියක් ලබාදී 2027 වර්ෂය සඳහා බදු දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

සේවකයෙකු යෙදවීමේදී ඔහුට ගෙවන වැටුප වියදමක් ලෙස හදුනාගත යුතු බවත්, එක් රථයකින් දිනකට එක් වරක් පමණක් ආදායම ලබාගත යුතු නිසා උදෑසන බස් ආදායම දිවා අවස්ථාවේදී ආවරණය විය හැකි බවත්, තාක්ෂණික යන්ත්‍ර සඳහා වියදම් දැරුවත් ඒවා පාලනය අපහසු විය හැකි බවත්, රු. 250,000ක මුදල සාධාරණ අගයක් නිසාත් එම යෝජනාව ස්ථිර කරන බව එම්.ටී.එම්. රුමි මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, සභාව සතු භූමිය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථ නැවතීමට ලබා දීමට අදාළව ගාස්තු අය කිරීම මාසික අවම ලංසු වටිනාකම රු.250,000ක් සහ සභාව විසින් අනුමත කරන කොන්දේසි සමග ප්‍රාදේශීය ප්‍රසිද්ධියක් ලබාදී බදු දීමට, සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 4 ලෙස</u>** 2026 ජූලි මස දෛනික වැටුප් ලෙස සේවකයින් 34 දෙනෙකු වෙත සභා අරමුදලින් රු.1,815,148.04 ක මුදලක් ගෙවීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තමන් මෙම ගෙවීමට එකඟ නොවන බව එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් සභාවට දන්වන ලදී. මෙම සේවකයින් පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර පියවරක් ගැනීමට යෝජනා වුවත් එය ඉටුවී නොමැති බවත්, සෑම විටම සුපිළිපන්නබව ක්‍රියාවෙන් පෙන්විය යුතු බැවින් ගෙවීමට එකඟ වීම සුදුසු නැති බැවින් විරෝධය පළකරන බවත්, ජනාධිපතිවරණය ආසන්නයේ ස්ථිර කළ සේවකයින් පත්වීම් ලබාගත් තනතුරු වල සේවය නොකිරීම නිසා අමතර සේවකයින් යොදවා ගැනීම ගැටලුවක්, පසුගිය දිනක ට්‍රැක්ටර් රථ රියදුරෙක් බීමත්ව රිය ධාවනය කරල පොලිසිය විසින් අල්ලා ගෙන තියනව, ලේකම්තුමා සහ සභාපතිතුමා පොලිසියට ගිහිං ඔහුව බේරගෙන තිබෙනව, මෙවන් අයට වරප්‍රසාද ලබාදීම සුදුසු නැහැ, නීතිය ක්‍රියාත්මක වීමට බාධා කිරීම සුදුසු නැහැ, අද දිනත් නගරයේ කාණු පිරිසිදු කසල රැස් කිරීම් සඳහා සේවකයින් යොදවල තියනව, ලංකා බැංකු පැරණි ගොඩනැගිල්ල පිටුපස ස්ථානයකට සභාවේ වාහන සහ සේවයින් යොදවල පිරිසිදු කිරීම් සිදුවෙනව මේ වෙලාවෙත්, මේ විදිහට පුද්ගලික වැඩ වලට සේවකයින් යෙදීම් වැරදි ක්‍රියාවක්, පුස්තකාලය තුළ කාර්යාල කාර්ය සේවකයින් පස් දෙනෙක් සිටියද කාර්යාලයේ කටයුතු සඳහා සිටින්නේ දෙදෙනෙකු පමණක් බැවින් මේ දේවල් විධිමත් විය යුතුයි,

ආදී ලෙස කරුණු ඉදිරිපත් කරමින් මෙම ගෙවීම් යෝජනාවට ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් විරෝධය පළ කරන ලදී.

මෙලෙස මත්ද්‍රව්‍ය භාවිතයක් සහා සේවකයින් විසින් සිදු කර තිබේනම් ඒ සඳහා විනයානුකූල පියවර අරං තිබේද දැනගැනීමට අවශ්‍යයි, පෙර අවස්ථාවල තමන් සභාපති ලෙස කටයුතු කරන කාලයේ මෙවන් දේවල් වළක්වා තිබෙනවා, එලෙස පාලනය පවත්වා ගත යුතුයි, ආදී ලෙස කරුණු ඉදිරිපත් කරමින් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

පුද්ගලික කටයුතු වලට කිසිම අවස්ථාවක සේවකයින් යෙදවීමක් සිදු නොකරන බවත්, පැරණි ලංකා බැංකුව පිටුපස කොටසට ටිපර් හා බැකෝ යන්ත්‍ර අද යොදවා තිබෙන්නේ එම ස්ථානයේ ඩෙංගු ව්‍යාප්ත විය හැකි සහ සෞඛ්‍යාරක්ෂිත නොවන තත්ත්වයක් තිබෙන නිසා බවත්, සේවකයින් මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බවක් වාර්තා වී නොමැති බවත්, පොලිසිය විසින් එවන් චෝදනාවක් ඉදිරිපත් කර නැති බවත්, අපරීක්ෂාකාරී රිය ධාවනයක් සඳහා රියදුරෙකුට වරදක් දන්වා ඇති බවත්, චෝදනාවක් වාර්තා වී නොමැති නිසා විනයානුකූල පියවර ගැනීම කළ නොහැකි බවත්, සේවකයින් සේවයේ යෙදවීම සේවයේ අවශ්‍යතා අනුව සිදුවන බවත් ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී.

සේවකයින් මාර්ග සංවර්ධන අධිකාරියේ කාණු පිරිසිදු කිරීමට යෙදවීම සුදුසු නැති බවත්, සේවකයින් යෙදවීම සාධාරණ ලෙස සිදු වියයුතු බවත්, එලෙස කටයුතු වේ නම් මෙවන් ගෙවීම පිළිබඳව ඉදිරියේදී සලකා බැලීමට සිදුවන බවටත් අවධානය යොමු කරමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

සේවකයින් වෙනත් රාජකාරී වල යොදවා ඇත්නම් ඒවා නිවැරදි විය යුතු බවත්, එම නිසාම මෙම ගෙවීම සුදුසු නැති බව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභා කාර්ය මණ්ඩලය කාණු පිරිසිදු කිරීමට යෙදවීමට සිදුවෙලා තියෙන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය වැඩ මගහැර තිබෙන නිසා බවත්, ඔවුන්ගෙන් වගකීම ඉටුකර ගැනීමට මැදිහත් විය යුතු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නගරයේ කාණු බොහොමයක් ඉතාම අපිරිසිදුයි, ඉතිහාසයේ ඉඳන්ම මේව පිරිසිදු කළේ නගර සභාව, පිරිසිදු කළේ නැත්නම් බලපෑම ඇති වෙන්නේ නගර වැසියන්, ඒවාට මැදිහත් වුනේ නැත්නම් දෝෂදර්ශනයට ලක් වෙන්නේ නගර සභාව, නගරයෙන් පිට වැඩ වලට සේවකයින් යෙදවීම් සිදු වෙන්නේ නෑ, කාණු පිරිසිදු කලේ නැත්නම් සෞඛ්‍ය ගැටලුවක් ඇතිවෙනව, සභාව අපහසුතාවයට පත්වෙන් දෙන්න හොද නෑ, මීට පෙර කසළ ටෙන්ඩරයට කාණුත් ඇතුළත්ව තිබුණ, ගාස්තු අඩු කර ගන්න ඒක ඉවත් කළේ, ඒව අමතක කර කතා පමණක් සිදු කිරීම සුදුසු නෑ, ආදී ලෙස කරුණු ඉදිරිපත් කරමින් ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

කරුණු එසේ වුවත් එදා වුන දේවල් අද නිවැරදි විය යුතු බව තමන් අදහස් කළ බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව බෙදීමකින් තීරණය කළ යුතු බවට ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා යොජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් සිදු කිරීමට ගරු සභාපතිතුමා විසින් අවස්ථාව සලසන ලදී.

ලේකම් විසින් මුලාසනයෙන් ආරම්භ කර ඒ ඒ සභික නියෝජිතගේ නම විමසමින් යෝජනාව සම්මත කිරීම සම්බන්ධයෙන් ඡන්දය විමසන ලදී. ඒ ඒ සභික නියෝජිතයින් විසින් තම ඡන්දය පහත පරිදි පළ කරන ලදී.

1. ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමා - පක්ෂයි
2. ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා - පක්ෂයි
3. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා - වැළකී සිටී
4. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රමී මැතිතුමා - වැළකී සිටී
5. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා - වැළකී සිටී
6. ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා - පක්ෂයි
7. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ජේමදාස මැතිතුමා - පක්ෂයි
8. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා - විපක්ෂයි
9. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිණිය - විපක්ෂයි
10. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිණිය - විපක්ෂයි
11. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්. චන්දන මැතිතුමා - පක්ෂයි
12. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන්. සේනාරත්න මැතිතුමා - පක්ෂයි
13. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා - පක්ෂයි
14. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා - විපක්ෂයි
15. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා - පක්ෂයි
16. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා - පක්ෂයි

ඉහත ප්‍රතිඵලය අනුව මෙම යෝජනාව බහුතර කැමැත්ත මත සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් සභාවට නිවේදනය කරන ලදී.

පෙ.ව. 11.00 ට දෙහිගස්තලාව එෆ්.එච් මාවත සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ටෙන්ඩර්පත් විවෘත කිරීම වෙනුවෙන් මෙම මහා සභාව මේ අවස්ථාවේ සිට කාරක සභා අවස්ථාවක් විය යුතු බවට ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මහා සභාව කාරක සභාවක් බවත් පත් වූ බව මූලාසනය විසින් දන්වන ලදී.

[කාරක සභා අවස්ථාව විනාඩි 20 ක් පමණ ක්‍රියාත්මක විය.]

කාරක සභාව මේ අවස්ථාවේ සිට මහා සභා අවස්ථාවක් විය යුතු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. කාරක සභාව මහා සභාවක් බවත් පත් වූ බව මූලාසනය විසින් දන්වන ලදී.

ඒ අනුව කාරක සභා අවස්ථාවේදී පැවති ටෙන්ඩර්පත් විවෘත කිරීම අනුව දෙහිගස්තලාව එෆ්.එච් මාවත සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා එක් ලංසුවක් ඉදිරිපත් කර තිබූ බවත්, KVC Products & Engineering ආයතනය විසින් රු.4,745,987.84 ක ලංසුවක් ඉදිරිපත් කර ඇති බවත්, මෙහි ඉංජිනේරු ඇස්තමේන්තුව රු.4,200,000.00ක් බවත්, ඒ අනුව මෙය තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමුකිරීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කළ බවත් සභාව වෙත නිවේදනය කරන ලදී.

<u>යෝජනා අංක 5 ලෙස</u> 2026 ජුලි මාසය තුළ සභාවේ වාහන හා යන්ත්‍ර සූත්‍රවලට ඉන්ධන සපයා ගැනීමට අදාළ බිල්පත් පියවීම සඳහා සභා අරමුදලින් රු. 1,187,279.00 ක මුදලක් BKJ Petroleum ආයතනය වෙත ගෙවීම් කිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මූලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ ඒ වාහන වල ධාවනය කළ දුර ප්‍රමාන ඇතුළත්ව වාර්තාව ඉදිරිපත් කිරීම සුදුසු බව එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>යෝජනා අංක 6 ලෙස</u> නගර සභා ක්‍රීඩා පිටියට යාබදව සකස් කර ඇති අඩි 2.5x7 ප්‍රමාණයේ පුවරු 15 දැන්වීම් ප්‍රදර්ශනය සඳහා 2026.08.25 දින සිට 2027.12.31 දක්වා බදු පදනමින් ලබාදීමටත්, දැන්වීම් පුවරුවක් භාවිතය සඳහා මාසික අවම ලංසු මුදල රු.730.00 ක් ලෙස සලකා (ගැසට් මගින් ප්‍රකාශ කළ අගය සලකා) ප්‍රාදේශීය ප්‍රසිද්ධිය මගින් ටෙන්ඩර් ක්‍රියාත්මකකර බදුකරුවන් තෝරාගැනීමටත් මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම පුවරු තනි තනිව ලබා දෙන්නේද යන්න ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්. චන්දන මැතිතුමා විසින් විමසන ලදී. පෙර වර්ෂයේ අය කිරීම කොපමණද යන්න ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් විමසන ලදී. ගාස්තුව අවශ්‍ය නම් සංශෝධනය කළ හැකි බව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පෙර වර්ෂයේ අයකිරීම එක් පුවරුවකට රු.530ක් බවත්, පුවරු අංක කර ඇති ආකාරයට තනි තනිව ටෙන්ඩර් වන බවත් ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>යෝජනා අංක 7 ලෙස</u> නගර සභාවේ විදුලි නඩත්තු අංශයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය (දෙදෙනෙකු) සඳහා 2026.11.26 දක්වා පවත්වාගෙන යන රක්ෂණාවරණය පවත්නා ප්‍රතිලාභ යටතේම එදිනෙන් පසු ඉදිරි වර්ෂයක් සඳහා දීර්ඝ කිරීම සඳහාත්, 2026.11.19 දක්වා පවත්වාගෙන යන ආයතනයේ මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණය පවත්නා ප්‍රතිලාභ යටතේම ඉදිරි වර්ෂයක් සඳහා දීර්ඝ කිරීම සඳහාත් ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙත සභා අරමුදලින් රක්ෂණ ගාස්තු ගෙවීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා වියදම කොපමණද යන්න සහ විදුලි කාර්මික දෙදෙනෙක් සිටීද යන්න ගරු නාගරික එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් විමසන ලදී.

රක්ෂණ සංස්ථාවේ මිල ඉදිරිපත් කිරීමට අනුව මේ වර්ෂයේ ගෙවීම සිදුවන බවත්, විදුලි කාර්මික හා සහය කාර්ය මණ්ඩලය එක් අයෙක් ආවරණයට ඇතුළත් වන බවත් දන්වමින්, ගරු සභාපතිතුමා විසින් පෙර වර්ෂයේ අයකිරීම සභාවට දන්වන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 8 ලෙස</u>** බළන්ගොඩ නගර සභාව විසින් පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුම්වලට අදාළ චෙක්පත්වල පළමු අත්සන්කරු ලෙස කටයුතු කළ එස්.එච්.ඒ. කරුණාරත්න මිය විශ්‍රාම පූර්ව නිවාඩු යාම නිසා ඒ වෙනුවට එම බැංකු ගිණුම්වලට අදාළ චෙක්පත්වල පළමු අත්සන්කරු ලෙස කටයුතු කිරීමට වර්තමාන ලේකම් එන්.ජී. දුමින්ද චින්තක වික්‍රමසිංහ මහතාට බලය පැවරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 9 ලෙස</u>** නගර සභාවේ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික ප්‍රසම්පාදන කමිටුව ලෙස සභාවේ සභාපති, සභා ලේකම්, ගණකාධිකාරී සහ සභාව විසින් නම් කරන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මහා සභාව මේ අවස්ථාවේ සිට කාරක සභා අවස්ථාවක් විය යුතු බවට ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මහා සභාව කාරක සභාවක් බවත් පත් වූ බව මුලාසනය විසින් දන්වන ලදී.

[කාරක සභා අවස්ථාව විනාඩි 10ක් පමණ ක්‍රියාත්මක විය.]

කාරක සභාව මේ අවස්ථාවේ සිට මහා සභා අවස්ථාවක් විය යුතු බවට ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. කාරක සභාව මහා සභාවක් බවත් පත් වූ බව මුලාසනය විසින් දන්වන ලදී.

සභාවේ ප්‍රසම්පාදන කමිටුව සඳහා මහා සභාව නියෝජනය කිරීමට ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා නම් කරන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**යෝජනා අංක 10 ලෙස** බලන්ගොඩ නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කොම්පෝස්ට් අංගනය පවත්වාගෙන යන, කඩයිම් සිතියම් 620087 හි කලාප 02 හි කැබලි අංක 2.57 දරන හෙක්ටයාර් 1.3005 ක් පමණ විශාලත්වයෙන් යුතු බැංකියවත්ත ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් බලන්ගොඩ නගර සභාව වෙත පවරා ගැනීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගෙවිය යුතු ගාස්තුව කොපමණ ද යන්න එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් විමසන ලදී. විකුණුම්කර ලෙස ලබාගැනීමේදී වැඩි ගාස්තුවක් ගෙවීමට සිදුවිය හැකි නිසා ඒ පිළිබඳ අවධානය යොමු කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**යෝජනා අංක 11 ලෙස** 2026.07.01 සිට 2026.07.31 දින දක්වා කාලයේදී බලන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ කටයුතු සිදුකිරීම වෙනුවෙන් ටෙන්ඩර්කරු වන කේ. වාමලී ඉරේෂා යන අයට සභා අරමුදලින් රු.1,098,000.00 ක මුදලක් ගෙවීම් කිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පසුගිය කාලයේ අලුත්වැඩියාවනට යොමු කළ ට්‍රැක්ටර් රථයක සයිලන්සරයක් මාරුකිරීමක් ගැන සඳහන් කළ බවත් ඒ පිළිබඳව සොයා බැලීමට කටයුතු කරන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**යෝජනා අංක 12 ලෙස** බලංගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ රු.5,606,715.78ක දෙවන කොටස් බිල්පත ඉංජිනේරු නිර්දේශ සමග අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. එම ගෙවීම් නිරවුල් කිරීමට අමාත්‍යාංශය වෙතින් මුදල් ලද පසු එමගින් එම

කර්මාන්තකරුගේ බිල්පත් වටිනාකම් නිරවුල් කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එන්.ඩබ්.පී.ටී. ජයසේන මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>යෝජනා අංක 13 ලෙස</u> වැලිහරනාව මාර්ගයේ ප්‍රේමසිරි මහතාගේ නිවස අසල ජල කාන්දුව සම්බන්ධයෙන් ඇති වී තිබෙන ගැටළුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරමින්, මෙම ස්ථානයට පහළින් ඇති ජල හා වැසිකිලි ටැංකිවලට බලපෑමක් ඇති විය හැකි බැවින් සොයා බැලීම වැදගත් බව ද ප්‍රකාශ කරන ලදී.

මෙම කරුණ පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරන අවස්ථාවට තමන්ට හා කේ.ඩී ධර්මසිරි මහතා, කේ.එම්.එස්.ඩී කුලතුංග මහතා යන අයට සහභාගී වීමට අවස්ථා ලබාදෙන ලෙස එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද අතර ටැංකියේ ජල කාන්දුවක් නොමැති බව ජල සාම්පල පරීක්ෂාවකදී තහවුරු වී ඇති බව දැනගන්නට ලැබුණ බව නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ජල ටැංකිවල කාන්දුවක් නොමැති බව හඳුනාගත් බව දන්වමින්, එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>යෝජනා අංක 14 ලෙස</u> බළන්ගොඩ නගර සභාවේ කසළ ටෙන්ඩරය ලබාගෙන ඇති ටෙන්ඩර්කරුට ඔහුගේ සේවය අගයමින් සභාව මගින් ප්‍රසංශාත්මක ලිපියක් ලබාදීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. ගුණරත්න මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පළාතේ හොඳම නගරය ලෙස බලංගොඩ නගරය තේරීම නිසා මෙම අගය කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ හේතුවෙන් කාර්ය මණ්ඩලය ද ඇගයීමට ලක් කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 15 ලෙස</u>** 2027 වර්ෂයේ බළන්ගොඩ තුඹගොඩ සාංඝිකාරාම විහාරස්ථානයේ මිහිඳු පෙරහැරට පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු. ලක්ෂයක් ලබාදීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 16 ලෙස</u>** බළන්ගොඩ වෙට්නෝල් මාර්ගයේ විදුලි බල මණ්ඩලය ඉදිරිපස මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන පිළිසකර කිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**<u>යෝජනා අංක 17 ලෙස</u>** ඕලුගංතොට ගංඟාරාම පන්සල අසල කසළ බැහැර කිරීම සඳහා කසළ භාජන දෙකක් තැබීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිණියගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ප්‍රජාව කාණු අපවිත්‍ර කිරීම් සිදු කරන බවත්, ඊට පියවර ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය මැදිහත් නොමැති බවත්, එම ස්ථානය සෞඛ්‍යාරක්ෂිත කිරීමට පියවර ගන්නා ලෙසත් ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිණිය ප්‍රකාශ කරන ලදී.

ප්ලාස්ටික බෝතල් රඳවනයක් ලබා දීමට අවධානය යොමුව ඇති බවත්, වෙනත් කසල රැඳවුම් ලබාදීම සොයාබලා කළ යුතු කරුණක් බවත් දන්වමින්, එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>**යෝජනා අංක 18 ලෙස**</u> පෙට්ටිගලපාරේ නගර සීමාව කොටස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිණියගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>**යෝජනා අංක 19 ලෙස**</u> ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඩිපෝව ඉදිරිපිට පෙර පාසල අසල කුණු බැහැර කිරීම සකස්කිරීම හා කාණු පද්ධතියක් සකස් කිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිණියගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බව ද එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බවට සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>**යෝජනා අංක 20 ලෙස**</u> මාලිහාතැන්න මාර්ගයේ මීටර් 150ක දුරක් සංවර්ධනය කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී. බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>**යෝජනා අංක 21 ලෙස**</u> නගර සභා ආඥා පනතේ 136 වගන්තිය යටතේ පැවරී ඇති කාර්යයන් හා 137 වගන්තියේ සඳහන් කටයුතු ද සමග එකී පනත යටතේ හෝ වෙනත් නීතියක සඳහන් ප්‍රාදේශීය සභාව විසින් කළ යුතු කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අදාළව එකී පනතේ 159 වගන්තියට අනුව සහා අරමුදල යෙදවීමේදී වරකට රු.100,000.00 ක සීමාවට යටත්ව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රීති සංග්‍රහයේ 136 හා 137 වගන්තිවල කාර්යයන් සඳහා නගර සභාවේ ලේකම් එන්.ජී.ඩී.සී. වික්‍රමසිංහ මහතා වෙත නගර සභා ආඥා පනතේ 224 වගන්තිය යටතේ අධිකාරය පැවරීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමා මගින් සිදුකරන ආයතනික යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාවේ "ප්‍රාදේශීය සභාව" ලෙස සඳහන් ස්ථානය නගර සභාව ලෙස සංශෝධනය විය යුතු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් දන්වන ලදුව ඒ බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාවේ ප්‍රාදේශීය සභාව ලෙස සඳහන් ස්ථාන නගර සභාව ලෙස සංශෝධනය කර සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**හදිසි යෝජනා-** විධිමත් සභා අනුමැතියක් ලබා ගෙන නොතිබූ බැවින් පහත යෝජනා හදිසි යෝජනා ලෙස ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා සභාව වෙත නිවේදනය කරන ලදී.

**යෝජනා අංක 22 ලෙස** 2025 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.75,000 මුදලින් සපුමල් ක්‍රීඩා සමාජයට ක්‍රීඩා භාණ්ඩ ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**යෝජනා අංක 23 ලෙස** 2026 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.200,000ක මුදලින් බුලත්ගම මිතුරු සංසදයට බුෆේ සෙට් එකක් සහ නෙස්කැෆේ මැෂින් එකක් ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**යෝජනා අංක 24 ලෙස** 2026 මන්ත්‍රී ප්‍රතිපාදන රු.50,000ක මුදලින් සමඟි එක්සත් සුභසාධක සමිතිය වෙත ආධාරක සහිතව සින්ක් එකක් සහිත බුෆේ මේසයක් ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමියගේ යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

<u>**යෝජනා අංක 25 ලෙස**</u> 2026.08.08 දින නැණපහන සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවති කොණ්ඩා කැපීමේ දන්සල සඳහා ගෙවීමට ඇති රු.12,000ක බිල්පත සභාපති අරමුදලින් ගෙවීමට ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනාව යෝජනාව මුලාසනය විසින් කියවා ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින්, එම යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**( උ). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම : ඇත**

1. 2026.07.22 වන දින පැවති මුදල් කාරක සභාවේ වාර්තාව
2. 2026.08.04 වන දින පැවති පරිසර සෞඛ්‍ය හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තා මෙදින මහ සභාව වෙත ඉදිරිපත් කරන ලදී.මෙහිදී පරිසර සෞඛ්‍ය හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවේදී බුලත්ගම සුසාන භූමිය පිළිබඳව සාකච්ඡා කර ඇති බවත්, ඒ අනුව එහි වර්තමාන තත්වය කුමක්ද යන්නත් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් විමසූ අතර එහි කටයුතු කඩිනමින් මැදිහත්වී ඉටු කරන බවත්, මුරසේවය සඳහා සුදුසු සේවකයෙකු යෙදවීම පිළිබඳව සලකා බලමින් සිටින බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

   ඉදිරිපත් කරන ලද වාර්තා සඳහා එම ස්ථිර කිරීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් විමසන ලදී.

   සභාවේ නිහඬතාවයෙන් විරෝධතාවයක් නොමැති බව පෙනී යන බැවින් එකී වාර්තා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

**(ඌ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වර්තා සහ මහා සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම : ඇත**

**I.2026 ජූනි මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.15,387,564.22 |
| මූලධන ලැබීම් | රු.1,197,541.54 |
| වෙනත් ලැබීම් | රු.2,480,829.65 |
| මුළු ලැබීම් | රු.19,065,935.41 |
| පුනරාවර්තන වියදම් | රු.14,677,419.06 |
| ප්‍රාග්ධන වියදම් | රු.802,711.91 |
| වෙනත් වියදම් | රු.5,653,309.24 |
| මුළු වියදම් | රු.21,133,440.21 |

**II.2026.07.01 දින සිට 2026.07.31 දින දක්වා බළන්ගොඩ නගර සභාවේ ඉන්ධන වියදම් පිළිබඳ සාරාංශය**

| **2026 ජූලි ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල (රු) |
| 226-7521 | 21,392.00 |
| 227-5020 | 125,782.75 |
| 56-1906 | 31,325.91 |
| Bob Cat | 87,995.00 |
| GC 0001 | 29,496.00 |
| MM 8152 | 2,070.00 |
| JD 4684 | 2,070.00 |
| ND 5124 | 67,239.26 |
| ZA 5039 | 83,410.76 |
| LL 2110 | 59,627.44 |
| ZA 5326 | 8,140.00 |
| RD 8240 | 131,971.28 |
| PF 4006 | 69,550.36 |
| RC 1107 | 68,583.37 |
| RC 1118 | 74,562.87 |
| RD 8000 | 72,200.67 |
| ZA 9835 | 102,063.73 |
| QL 2901 | 8,004.69 |
| 37-7933 | 10,175.00 |
| HF 8558 | 38,088.67 |
| GK 6227 | 65,327.35 |
| HF 7899 | 169,584.44 |
| UQ 1933 | 3312.00 |
| DPP(Dengu Provincial Programme) | 11620.00 |
| For Premix | 19,100.00 |
| **TOTAL** | **1,362,693.56** |

2026/07/31 දිනට ගබඩාවේ ඉතිරි ඉන්ධන රු.73,667.00.00

**(එ). සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා අවස්ථාව**

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් මුගුණමලය මාර්ග නඩත්තුව පිළිබඳව සහ 2025.07.31 දිනැතිව හිටපු සභාපතිතුමා යොමුකර ඇති ජීවිත හා දේපළවලට අනතුරුදායකව පවත්නා කොහොඹ ගසක් සහ අඹ ගසක් සම්බන්ධ ලිපිය සම්බන්ධව පොලිසිය මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති වීම පිළිබඳව කඩිනම් අවධානය යොමු කරන ලෙසත් ළමා උද්‍යානයේ සෙල්ලම් උපකරණ කැඩී ඇති බැවින් ඒ පිළිබඳවද සොයා බලන ලෙසත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා**

පසුගිය දිනෙක ගවයෙක් නිවස අසල වැසිකිළි වලකට වැටී තිබූ අවස්ථාවේදී සභාපතිතුමා මැදිහත්වී සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදවා මහත් පරිශ්‍රමයක් දරා එම සත්වයාව බේරගැනීම සම්බන්ධව අවංක ආදර ගෞරවනීය ස්තූතිය පුද කරන බව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා**

තමන් මෙම සභාවට යෝජනා ඉදිරිපත් නොකළ බවත්, අද වන විටවත් පසුගිය සභාවට ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක නොවී ඇති බවත්, පන්සලවත්ත මාර්ගයේ,වාරිකා මාර්ගය යන මාර්ගවල ගමන් කිරීමට නොහැකි තත්වයට පත්ව ඇති බවත්, යාවකයන් පිළිබඳව සඳහන් කළා ඔවුන් මැණික් වෙළඳපළ අසල දැනටත් අශෝභනව හැසිරෙන බවත්, ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්, පොළ පරිශ්‍රයේ ත්‍රීවීල් පාක් එක පිළිබඳව සොයා බලන ලෙසත්,පොලේ ගාස්තු අය කරන නිලධාරීන් දෙදෙනාට එහි විදුලිය සහ ජලය සකස් කර දෙන ලෙස ගාස්තු අයකිරීමට යාමේදී තර්ජනය කිරීම තමන් දුටු බවත් ඒවා විධිමත් කරන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා**

නගරයේ අවිධිමත් ලෙස තැනින් තැන කුකුළු මස් අලෙවි කිරීම් සිදුවන බවත්, ඒවා මිනිස් පරිභෝජනයට සුදුසු ද නැද්ද යන්න පිළිබඳව සොයා බලන ලෙසත්, එවැනි ස්ථාන 61ක් පමණ නගරයේ පවතින බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා මේ පිළිබඳව දැනුවත් කරන ලෙසත්, එසේම මේ වන විට පොළ ඔත්පල වී ඇති බවත්, තොග පොල ඉරිදා හැර සතියේ දිනවල අයකරන රුපියල් 450 මුදල් අඩු කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරන ලෙසත්, එමෙන්ම කර්මාන්ත කමිටුව රැස්වීම මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බවත්, සිදුකළ වැඩ මොනවාද සිදුකිරීමට ඇති වැඩ මොනවාද යන්නවත් නොදන්නා බවත්, ඒ අනුව එම කටයුතු විධිමත් කරන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා**

තමන් කර්මාන්ත කමිටුවේ සභාපති ලෙස පත්වුවද කර්මාන්තවලට යෝජනා විශාල ප්‍රමාණයක් මේ වෙනුවට ලැබී තිබුණද සභාවේ මූල්‍ය තත්ත්වය හේතුවෙන් ඒවා ඉටුකර ගැනීමට නොහැකි තත්ත්වයක් මේ වන විට පවතින බවත්, රෝල සම්බන්ධව කතා කිරීමේදී අවම වශයෙන් රෝල තිබෙන ගරාජයෙන් එය ලබා ගැනීමටවත් මුදල් නොමැති බව මූල්‍ය අංශයෙන් පවසන බවත්, හැකි ඉක්මනින් විශේෂ සභාවක් හෝ කැඳවා කළ යුතු දේ තීරණය කරන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

මාස ගණනාවක් තිස්සේ කතා කිරීම වෙනුවෙන් සුද්ද කරා වෙනුවට උඩ කන්ද පාර හා කරවිකැටිය පාර සුද්ද කර ඇති බවත්, එම මාර්ගවල කාඩ්බෝඩ් එකතු කරන කඩයක් දමා එහි කැලි කාණුවට දමා ඇති බවත්, ඒ පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාද දැනුවත් කළ බවත්, ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

මෙම සභාවට තමන් යෝජනා ඉදිරිපත් නොකළ බවත්, යෝජනා ලබා දී තේරුමක් නැති බවත්, ඉරිදා පොළට ගොස් එහි පවතින වාහන තදබදය පිළිබඳව නිරීක්ෂණය කරන ලෙසත්,

එහි පාරිභෝගිකයාට භාණ්ඩ මිලදී ගැනීමට පහසුවන ආකාරයේ විධිමත් ආකාරයකින් සකස් කරන ලෙසත්, පොල ඉදිරිපිට අනවසර කූඩාරම් සවිකර ඇති බවත් ඒවා ඉවත් කරන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමන් පවසන ලදී.

**ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

පොලේ ගාස්තුව රු. 450 ගාස්තු අය කිරීම අසාධාරණ බවත්, දැනට වෙළෙන්දන් ප්‍රමාණය සීමා වී ඇති බවත්, මේ පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කිරීම සුදුසු බවත් ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමන් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් නවක ලේකම්තුමා වන දුමින්ද වික්‍රමසිංහ මහතා පිළිගන්නා බවත්, එතුමා තරුණ ජවයක් සහිත දක්ෂ ලේකම්වරයෙකු බවත්, පක්ෂභේදයකින් තොරව එතුමාගේ කටයුතු සාර්ථක කරගැනීමට සුබ පැතුම් එක් කරන බවත්, එමෙන්ම තමන් 2006 වර්ෂයේ සිට මෙම සභාවේ මන්ත්‍රීවරයෙක්, උපසභාපතිවරයෙක් ලෙස කටයුතු කළ බවත් එහිදී සහෝදරත්වයෙන් එකට ලේකම්තුමිය සමඟ කටයුතු කළ බවත් එතුමිය වසර දෙකකට ප්‍රථම විශ්‍රාම ගිය බවත්, එතුමිය තමන්ගේ රාජකාරිය වෙනුවෙන් තමාගේ ශක්තියෙන් බලන්ගොඩ නගර ජනතාව වෙනුවෙන් සේවය කළ බවත්, ඉතා දුෂ්කර අභියෝග රැසකට මුහුණ දී සභිකයන් නැති කාලවලදී එතුමිය නායකත්වය ලබාදී මෙම නගර සභාව සබරගමු පළාතේ හොඳම පළාත් පාලන ආයතනය මෙන්ම ලංකාවේ පළමු ස්ථානය පවා ලබා ගත් බවත්,කෙසේ හෝ එතුමියගේ පෞද්ගලික අවශ්‍යතා මත විශ්‍රාම යන බව දැන්වූ බවත්, එතුමියගේ විශ්‍රාම ජීවිතයේ සාර්ථක වේවා යන්න ප්‍රාර්ථනා කරන බවත්, එමෙන්ම නවක ලේකම්තුමාගේ සහයෝගය පළාත් පාලන කටයුතුවලදී බලාපොරොත්තු වන බවත් එතුමාගේ ඉදිරි අනාගතයට සුබ පැතුම් එක් කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

මෙම සභාවට ලේකම්තුමා ලිපියක් එවා එමගින් සභිකවරුන්ගේ සීමාවන් පිළිබඳව සඳහන් කර තිබූ බවත්, අද වන විට මෙම සභාව පත් වී වසර දෙකක් පමණ ගතවෙන බවත්, මෙහි සභාපතිවරයෙක් ලෙස තමන් වැඩ කළ කාලය සහ දැන් වැඩ කරන කාලය අතර පරස්පරයක් තිබෙන බවත්, දැන් මෙහි යම් අකර්මණ්‍යතාවයක් තිබෙන බවත්, එමෙන්ම හිටපු ලේකම්තුමිය පළාත් පාලන විෂයේ අති දක්ෂ නිලධාරිනියක් බවත්, එතුමියට එසේම දක්ෂතා ඇති සභාපතිවරුන් මන්ත්‍රීවරුන් සිටි බැවින් මෙම පළාත් පාලන ආයතනය අංක එකේ සිටි බවත්, එමෙන්ම මෙම බලන්ගොඩ නගර සභාව වෙනුවෙන් පක්ෂය පාට භේදයකින් තොරව අභිනව ලේකම්තුමාට මෙම සභාවේ ස්ථාවරය රැකගැනීමට සුබ පතන බවත්, වැඩ නොකරීමට විවේචන පැවතියද මෙය ආයතනයක් ලෙස වැටෙනවාට කවුරුත් කැමති නැති බවත් පවසමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**(ඒ). අවසානය**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තූතිය පුද කරන බව දන්වමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.12.55 ට පමණ අවසන් කරන ලදි.

**එන්.ඩබ්.පී.ටී ජයසේන,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.